# ඇවිත් නොරටක

ඔස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික පවුලක කතාවක්

කොටස් වශයෙන් පලවන නවකතාව....

## 25

පසුගිය කළාපයෙන්....

''මම නං හිතන්නෙම කවුරු හරි කොල්ලෙක් දැන්ම ඉඳලම යාලු කරගෙන ඇති අපිට නොකිව්වට''යි සුනිමල් කීවේ ය. ''ඔය හැම තිස්සෙම ටෙලිෆෝන් එකේ එල්ලීලා ඉන්න ඒ කොල්ල එක්ක වෙන්න ඇති කතාව, ඔයා තුන් හතර පාරක් ඇහුව නේද ?''

''ඇහුව තමයි, හැම තිස්සෙම මඟ ඇරල යනව ෆ්‍රෙන්ඩ් කෙනෙක් කියල'' නිර්මලී ශෝකී ස්වරයෙන් කීවා ය.

ප්‍රසංග ගෙදර පැමිණියේ රාත්‍රි දහයට පමණ ය. නිවස ඉදිරිපිට වාහනයක් නවත්වන හඬ ඇසූ නිර්මලී හා සුනිමල් ජනෙල් තිර රෙද්ද මෑත් කර බැලූහ. රතු පැහැති කුඩා මැස්ඩා රථයක් ගේ ඉදිරිපිට නැවැත්වූ විට වම් පස ඉදිරි දොර ඇරෙනවාත් රියදුරු අසුනේ සිටි යුවතියට හාද්දක් දුන් ප්‍රසංග වාහනයෙන් බසින සැටිත් ඔවුහු බලා සිටියහ. ප්‍රසංග බැස්ස විගස පසු පස ආසනයේ වාඩි වී සිටි යුවතියක් දොර ඇගෙන බැස විත් ඉදිරි පස අසුනේ වාඩි වූවා ය. තද අළු පැහැති වත්සුණු තැවරුණු ඇයගේ මුහුණත් දෙවටොර නිරාවරණය වන සේ ඇය ඇඳ සිටි කොට සායත් මඳ එළිය අතරින් නිර්මලී දුටුවා ය. ඔවුන් හඬ නගා කතා බස් කරමින් සිනාසෙන හඬ වාහනය ඉවත්ව යන තෙක්ම ඇසිණි. නිර්මලීගේ සිත තුළ ඇතිවූයේ දැඩි කම්පනයකි. ප්‍රසංග ගෙතුළට විත් කාමරයට යන හඬ ඇසිණි. ප්‍රසංග කුඩා කාලයේ දී මෙන් ඔහුගේ කාමරයට ගොස් තරවටු කිරීමට ශක්තියක් නොමැති වීම ගැන නිර්මලී තුළ ඇතිවූයේ ශෝකය මුසුවූ කෝපයකි. ඇය සුනිමල් අසලින් ඇඳෙහි වැතිර දෑස පියා ගත්තා ය.

ඇඳෙහි වැතිර සිටි අවන්ති තම අඩ නිරුවත් කය, පොඩි වී පැත්තකට තල්ලු වී තිබුණු පොරෝණයෙන් වසා ගත්තා ය. ඇයගේ මුහුණත් දෙකණත් රත්පැහැ ගැන්වී ඇත. යටි බඩ පුරා මඳ වේදනාවක් පැතිරෙන්නා සේ ඇයට දැණින. ඇඳෙන් නැගිට්ට ජේසන් නාන කාමරයට ගියේ මීට ස්වල්ප මොහොතකට පෙර ය. නාන කාමරය තුළින් මහ හඬින් වතුර වෑස්සෙන හඬ අතරින් ජේසන් උගුර පාදන හඬ ද ඇසේ.

අවන්තිගේ දහ අට වන උපන් දිනය සැමරීමට නගර මධ්‍යයේ අවන් හලකට ඔවුන් දෙදෙනා ගියේ දහවල් කාලයේ ය. අවන්තිගේ පාසල් මිතුරියන් දෙදෙනෙක් ජේසන් හා අවන්ති දෙදෙනාම හඳුනන 'කේ මාට්' වෙළෙඳ සංකීර්ණයේ ඔවුන් සමඟ වැඩ කරන ශේන් හා ඇන්ඩෲ ද ඔවුන් සමග සාදයට සහභාගි වූහ. 'මත් පැන් නොබොමි'යි කොතරම් අදිටන් කරගෙන සිටිය ද මේසයේ හිඳ සිටි මිතුරු මිතුරියන්ගේ බල කිරීම නිසා අවන්ති වයින් වීදුරු දෙකක් පානය කළා ය.

සාදය අතර තුරදී දෙවරක් ම ජේසන් තමා වැළඳගෙන තම දෙතොල දැඩිව සිප ගත් සැටි අවන්ති සිහි කළේ සිරුර පුරා දිවගිය කිසියම් ආකර්ශණීය හැඟීමකින් යුතුව ය. අඳුර වැටීගෙන එද්දී සාදය අවසන් වීමෙන් පසුව සුපුරුදු ලෙස අවන්ති ගෙදර අසල බස් නැවතුම් පොළ දක්වා ජේසන් විසින් ගෙනත් ඇරලනු ඇතැයි ඔහුගේ රථයේ ඉදිරි පස අසුනේ ඉඳ සිටි අවන්ති සිතුවා ය. එහෙත් ජේසන් ඔහුගේ තට්ටු නිවාසය පිහිටි මාවතට වාහනය හරවනු දුටු අවන්ති නොසන්සුන් වූවා ය.

''මට අද එන්න බෑ ගෙදර යන්න ඕන'' අවන්ති ජේසන් ගේ අතින් අදිමින් කිවා ය. ''රෑ උනාම අම්ම හොඳට ම බනිනවා''

ඇය ඉංග්‍රීසි බස හසුරුවන ආකාරය ජේසන් ගේ සිත් ගනී. ඔහු තම තට්ටු නිවාසයේ ගරාජයට වාහනය ඇතුළු කර වාහනයෙන් නොබැස ම අවන්ති තුරුලු කරගෙන ඇයගේ මුහුණත් දෙතොලත් සිප ගත්තා ය.

''අද මට බෑ''

''ඉට්ස් ඕල් රයිට්, අයි විල් ඩ්‍රොප් යූ'' ජේසන් කීවේ ය.

මීට පෙර හතර පස් වරක් ජේසන්ගේ තට්ටු නිවාසයට පැමිණ පැය කීපයක් ගත කළ හැටි අවන්ති සිහි කළා ය. ඇය ගේ සිරුර උණුසුම් හැඟීමකින් වෙලා ගත්තාක් මෙන් ඇයට දැණින.

ඇඳෙහි වැතිර සිටි අවන්ති වසර එක හමාරක් තිස්සේ තමාත් සුදු ජාතික තරුණයකු වූ ජේසන් අතරත් ඇති සමීප සම්බන්ධතාවය ගැන සිහිපත් කළා ය. පළමුව ඔවුනොවුන් මුණ ගසුනේ අවන්ති 'කේ මාට්' වෙළඳ සංකීර්ණයේ අනියම් සේවිකාවක ලෙස වැඩ කිරීමට පටන් ගත් දිනවල ය. එකොලොස් වන වසර අවසානයේ දී ලැබුණ නිවාඩු කාලයේ දී වෙළඳසැල් වල තාවකාලික රැකියාවන් සඳහා යන තම යහළු යෙහෙළියන් ගේ බලපෑම අනුව අවන්තිටත් එවන් තාවකාලික රැකියාවක් සඳහා යාමට සිතිණ. එම අදහස දෙමව්පියන්ට දැන්වූ විට නිර්මලී වහාම විරුද්ධ වූවා ය.

''ඕන නැහැ දැන්ම ඔය ජොබ්ස් වලට යන්න. ඉගෙනීමේ වැඩ කරගන්න වෙලාව නැති වෙන්නෙ ඕවට ගියාම තමයි''

සුනිමල් මෙයට වෙනස් මතයක් දැරුවේ ය.

''මේ ළමයි මෙහේ හැදෙන අය, මේ ජීවිතයට පුරුදු වෙන්න ඉඩ දෙන්න ඕනෙ''යි සුනිමල් කීවේ ය. ''තමුන්ගේ වියදමට ඉතින් සුළු ආදායමකුත් ලැබෙනව නේ''

සති අන්තයේ දෙදින තුළ පැය පහක් ''කේ මාට්'' වෙලඳ සංකීර්ණයේ වැඩට යාම අවන්තිට සතුටක් ගෙන දුන්නේ ය. එහි වසර කීපයක් සේවය කරන ජේසන් තමා සමග කතා බස් කිරීමට මහත් කැමැත්තක් දක්වන බව අවන්තිට වැටහිණ. වැඩ මුරය අතර කෙටි විවේකය ලැබුණ විට ජේසන් අවන්ති කැඳවාගෙන දෙවන තට්ටුවේ භෝජන ශාලාවට ගෙස් උණුසුම් චොකලට් වීදුරුවකින් හෝ අයිස් ක්‍රීම් බඳුනකින් ඇයට සංග්‍රහ කළේ ය.

ජේසන් තමා කෙරෙහි දක්වන සැලකිල්ල හා අවධානය කරදරයක් සේ මුලින් දැනුනත් දෙමාසයක් පමණ ඉක්ම ගිය තැන සති අන්තයේ අවන්ති ''කේ මාට්'' වෙළඳ සංකීර්ණයට ගියේ වැඩ කිරීමටත් වඩා ජේසන් හමුවී කතා බස් කිරීමෙන් ලැබෙන සතුටුදායක අත්දැකීම් සිහි කරමිනි. ඔහු දිනපතා ම වාගේ අවන්තිට දුරකථනයෙන් කතා කළේ ය. ඔහුගේ පෞද්ගලික තොරතුරු අවන්ති සමග කීවේ ය. අවන්ති දුටු දිනම සිට ඇයගේ කලු පැහැති දීප්තිමත් නෙත් යුවලටත්, කෙස් වැටියටත්, දුඹුරුවන් හමටත් ප්‍රිය කරන බව ජේසන් අවන්තිට කීවේ ය. අසාර්ථක විවාහයකින් දික්කසාද වී සිටින ජේසන් හය හැවිරිදි පුතා ගැන ද ජේසන් ඉඳ හිට අවන්ති සමග කතා කළේ ය. ජොෂුවා නමැති තම පුතා දැන් තම බිරිඳ සමග සිටින බවත් සති තුනකට වරක් ඔහු පුතා බලන්නට යන බවත් ජේසන් අවන්ති සමග කීවේ ය. ඔහුගෙන් මේ තොරතුරු ඇසූ අවන්ති තුළ ඇති වූයේ කණගාටුවකි. තමන් සමග කතා බස් කරමින් සිටින විට ඔහුගේ කතා බහෙත් හැඩ රුවේත් කිසියම් සිත් අදනා බවක් ඇතැයි අවන්ති සිතුවා ය.

මේ සම්බන්ධතාවය ගැන මවටත් පියාටත් කිව යුතු යයි අවන්ති සිතුවේ නැත.දහවන පන්තියේ සිටම තම පන්තියේ සිටි යෙහෙළියන් ගේ ප්‍රේම සබඳතා ගැන ඇය දනී. ඒ බොහොමයක් ම ඇයගේ පාසලේ ඉහල පන්ති වල හෝ ඇයගේ ම පන්තියේ යහළු යෙහෙළියින් අතර පැවති සම්බන්ධතාවයන් ය. එම සම්බන්ධතාවයන් වසර දෙක තුනකට වඩා කල් නොපැවති බව ඇයට මතක ය. එක් යෙහෙළියකට පමණක් ඔහුගේ මිතුරා සමග විවාහ වන්ට සිදුවූයේ ඇයට පාසලෙන් අස්වීමට පෙර දරු ගැබක් පිහිටීම නිසා ය. තමා පාසලේ සිටි අවසාන අවුරුදු තුන ඇතුළතදී බොහෝ යහළු යෙහෙළියන් අතර පැවති ප්‍රේම සබඳතා කිහිප වරක් ම බිඳී ගොස් ඔවුන් අළුත් සබඳතාවලට එළඹුනු සැටි අවන්තිට මතකය. තමන් හා ජේසන් අතර ඇති සබඳතාව අම්මාට පැවසුවහොත් ඇය මහත් කලබලයට පත්වී නිවස තුළ මහත් කලබැගෑනියක් ඇති කරන බව අවන්තිට නොරහසකි.

ජේසන්ගේ ඉල්ලීම පිට කිහිපවරක් ම ඔහුගේ තට්ටු නිවාසයට යාම මුලදී අවන්තිට නුහුරු අත්දැකීමක් විය. ඔහු ගේ නිවසට ගිය පළමු දින ඇය බියෙන් හා තැති ගැනීමෙන් ගත කළ සැටි සිහිකරන අවන්ති දැන් ඒ අත්දැකීම් සිහි කරන්නේ කිසියම් ආස්වාදයකින් යුතුව ය. මාස කිහිපයකට පසු දෙදෙනාම ඔවුනොවුනට පුරුදු වූහ. සතියකට වරක් හෝ දෙවරක් වැඩ අවසන් වූ පසු ජේසන්ගේ තට්ට නිවාසයට යන අවන්ති ගෙදරට ලඟාවූයේ ජේසන් විසින් ඔහුගේ රථයෙන් ඇයගේ නිවස අසල බස් නැවතුම් පොලට ඇරලීමෙන් පසුව ය. එතැන් සිට පයින් ම නිවසට ගිය තමා බසයෙන් බැස ගෙදරට එන්නට ඇතැයි තම දෙමාපියන් විශ්වාස කරන්නේ යයි අවින්ති සිතුවා ය.

තමා සමග තට්ටු නිවාසයේ වාසය කිරීමට පැමිණෙන ලෙස ජේසන් කියන්ට වූයේ දෙමසක සිටය. අවන්ති එයට තරයේ විරුද්ධ වූයේ ඒ සඳහා තවම තමා සූදානම් නැති බව කියමිනි. එච්. එස්. සී. ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටි ඇය ජේසන්ට පැවසුවේ ප්‍රතිඵල නිකුත් වී ඇය විශ්ව විද්‍යාලයට යාමට පටන් ගත් විට ඔහු සමග තට්ටු නිවාසෙය් නතරවීම පිළිබඳව සිතා බලන බව ය.

''මොකටද යුනි යන්නේ ?''ජේසන් ඇසුවේ ය. ''ජොබ් එකක් කරන්න ඔය ඉගෙන ගත්ත මදිද?''

''අපොයි අම්මයි තාත්තයි මාව මරල දායි යුනි ගියේ නැත්තං''

විශ්ව විද්‍යාලයට යාමට අවන්ති මෙතරම් උත්සාහ කරන්නේ කුමක් නිසාදැයි ජේසන්ට අබබෝධ කර ගැනීම අපහසු විය. එදින ඇය ඇරලීමට ඇයගේ නිවස අසල බස් නැවතුම් පොළ දක්වා යන තෙක් ම තමා සමග වාසය කිරීමට එන ලෙස ජේසන් කීප වරක්ම ඉල්ලා සිටියේ ය. වාහනය පදවන ගමන් වම් අතින් ඇයගේ හිසකෙස් පිරිමදින ඔහු ඇයගේ මුහුණ අතගායි. අවන්ති ඔහගේ අතට ගසා රිය පැදවුම කෙරෙහි අවධානය යොමු කරනලෙස ඉල්ලා සිටියි. ඔහුගේ අතේ ස්පර්ශයෙන් තම ගත පුරා දිවයන නොපැහැදිලි උණුසුම් හැඟීමට ඉඩදී ඒ තුළ බොහෝ වේලා රැඳී සිටීමේ ආසාව කෙමෙන් ඇය තුළ පැන නගියි. මෙවන් හැඟීමක් ඇතිවූ විටෙක ජේසන් සමග තට්ටු නිවාසයේ වාසය කිරීමට ඇය තුළ ආසාවක් ඇතිවේ.

අවන්තිගේ එච්. එස්. සී. විභාග ප්‍රතිඵල පිටවූ දිනි කාටත් වඩා සතුටු වූයේ නිර්මලී ය. අවන්ති කැමැත්තෙන් සිටි වාණිජ විද්‍යා පාටමාලාව මැක්වයර් විශ්ව විද්‍යාලයේ හැදෑරීමට ඇයට අවස්ථාව ලැබී තිබිණි. නිර්මලීගේ වදෙන් පොරෙන් බේරෙන්නට විෂයයන් දෙකකට පමණක් අතිරේක පන්ති ගිය ඇය ඒ විෂයන් දෙකට පමණක් නොව අනෙකුත් විෂයනටද අනු දෙක ඉකමවා ලකුණු ලබාගෙන තිබුණි.

''මම හිතුවෙ නෑ තාත්ති මේ කෙල්ල ඔය තරම් වත් ලකුණු ගනියි කියල තිබ්ච්ච නැටිල්ලෙ හැටියට'' නිර්මලී සිනාවෙන් එළිය වුනු මුහුණ සුනිමල් දෙසට හරවමින් තෙපළා ය.

''මම නං දැනගෙන හිටියෙ, ප්‍රසංගට වැඩිය අවන්තිට ඕන දෙයක් එක පාරට තේරෙනව. ඉගෙනීමෙ දෙයක් වුනත් ඒවගේ, මට පොඩි කාලෙ ඉඳලම තේරුණා''

''කෝ අවින්ති අප්පච්චිට කිව්ව ද ?''

''අප්පච්චිටත් හරි සතුටුයි දැන් මුණුබුරයි මිණිබිරියි දෙන්නම විශ්ව විද්‍යාලෙට යනවනෙ. මායි අප්පච්චියි දෙන්නම ගියා මේ ළමයට කතා කරන්න. කෝ පත්තරේ රිසල්ට්ස් බැලුව විතරයි ඔන්න ටෙලිෆෝන් එකේ එල්ලිලා''

නිර්මලීගේ හඬේ වෙනදා ඇති අමනාපය අද නැති ලෙසකි සුනිමල්ට හැඟුනේ, විභාග ප්‍රතිඵල පිළිබඳව දෙමාපියන් හා සීයා සමග කතාබස් කර සතුට බෙදාගත් අවන්ති ලහි ලහියේ ලැහැස්ති වූයේ ජේසන් හමුවීමට ය. නෝර්ත් සිඩ්නි ප්‍රදේශයේ අවන් හලකදී හමුවීමටය ඔවුන් දෙදෙනා දුකථනයෙන් කතිකා කර ගත්තේ.

''දුව කොහේද මේ යන්නේ අද සන්තෝස දවසෙ ගෙදර ඉන්න එපායැ'' කොට සායක් ඇඳ, ළැම පෙදෙස අඩක් පෙනෙන සේ හැඳගත් කොට හැට්ටය ඔසවමින් රතුවන් තොල් ආලේපයක් තොලේ දවටන අවන්ති දෙස බලමින් පලිපාන ඇසුවේ ය.

කාමරය දෙවනත් කරන තරම් උස් හඬින් නගින සංගීත රාවය නිසා පලිපාන කියූ දේ අවන්තිට නොඇසිණ.

ලබන කලාපයට.....



පාලිත ගනේවත්ත

සිඩ්නි